# සමාසික ක්‍රමය පිළිබඳ
# පර්යේෂණාත්මක ඇගයීමක්

මහාචාර්ය සිල්වි සේනාධීර
අංශාධිපති - අධ්‍යාපන අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**හැඳින්වීම**

අධ්‍යාපනය ඕනෑම රටක සැලසුම් සහගත ව ක්‍රියාත්මක විය යුතු වැදගත් ආයෝජන ක්‍රියාවලියක් බව ආර්ථික විද්‍යාඥයින්ගේ පිළිගැනීම වේ. වර්තමාන පරපුරට අධ්‍යාපනය ලබාදීම සඳහා ලංකාවේද ක්‍රියාත්මක වන විවිධ ආයතන දැකිය හැකි ය. පාසල් කාර්මික විද්‍යාල, සහ විශ්වවිද්‍යාල ඒ අතර ප්‍රධාන තැනක් ගනි. උසස් අධ්‍යාපනය ලබා දෙන ප්‍රධානම ආයතනය ලෙස විශ්ව විද්‍යාලවලට ප්‍රමුඛ ස්ථානයක් හිමිවේ.

විශ්වවිද්‍යාලය තුළින් ශිෂ්‍යයන්ට ශාස්ත්‍රීය දැනුම ලබා දෙන අතර ම නව දැනුම උත්පාදනය සඳහා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම ද විශ්වවිද්‍යාලය සතු කාර්යයක් වේ. එසේ වුවත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ව විවිධ විවේචන එල්ල වෙමින් පවතී. සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලය යනු හුදකලාවූ එක්ටැම් ගෙවල් බවත්, වඳවී යන සත්ව කොට්ඨාශ බවත්, නිකමුන් බෝකරන ස්ථාන බවත් ප්‍රකාශ වේ. එයට ප්‍රධාන හේතුව උසස් අධ්‍යාපන ක්‍රියාවලියෙහි සිදුවන නව වෙනස් වීම් අනුව අනුවර්තනය වීමට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඇති නොකැමැත්ත බව ඇතැම්හු විශ්වාස කරති.

වර්තමානයේ විශ්වවිද්‍යාල තුළින් බිහිවන උපාධිධාරීන් නිපුණතා රහිත, දැනුමක් නොමැති, පිරිසක් බවත්, ඒ නිසා ම රැකියා විරහිත භාවය ඇතිවී තිබෙන බවත් ප්‍රකාශ වී ඇති තවත් මතයකි. පෞද්ගලික අංශයේ රැකියා විශාල ප්‍රමාණයක් ඇතත් ඒ සඳහා අවශ්‍ය භාෂා දැනුම, පරිගණක දැනුම හා වෘත්තීය කුසලතා නොමැති නිසා උපාධිධාරීන් බඳවා ගැනීමේදී ගැටළු මතුවන බව පෞද්ගලික අංශයේ අදහසයි. මෙවැනි අදහස් තුළින් විශ්වවිද්‍යාල අධ්‍යාපන රටාව ප්‍රතිසංවිධාන වීමේ අවශ්‍යතාව අවධාරණය වේ.

මේ තත්ත්වය පිටු දැකීම සඳහා විශ්වවිද්‍යාල තුළ නව ප්‍රතිසංස්කරණ විටින් විට හඳුන්වා දී තිබේ. 2000/2001 අධ්‍යයන වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට හඳුන්වාදෙන ලද සමාසික ක්‍රමය ද පීඨයේ විෂයමාලාව සහ ඇගයීම් ක්‍රමය නවීකරණය තුළින් ඉහත සඳහන් වූ ඇතැම් විවේචනය පිළිතුරු සෙවීමේ අභිලාශයෙන් ක්‍රියාත්මක වූ නව ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකි.

## 1. අරමුණු

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ක්‍රියාත්මක වන සමාසික ක්‍රමය පිළිබඳ ව පීඨයේ ශිෂ්‍යයන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය දරන අදහස් හා ආකල්ප පිළිබඳ ඇගයීමක් කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණු විය. ඒ අනුව. සමාසික ක්‍රමය තුළ ක්‍රියාත්මක වන විෂයමාලාව. ඉගැන්වීම ක්‍රම හා ඇගයීම් ක්‍රම යන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. සමාසික ක්‍රමය තුළ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා නව අදහස් හා යෝජනා ලබා ගැනීම ද ඒ තුළින් ඇති කළ යුතු වෙනස්කම් සොයා බැලීම ද, මෙම අධ්‍යයනයේ තවත් අරමුණක් විය. අවසන් වශයෙන් රැකියා විරහිත භාවය අවම කිරීම සඳහා උපාධි අපේක්ෂකයන් තුළ වෘත්තීය කුශලතා වර්ධනය කිරීමට සමාසික ක්‍රමය තුළින් යම් පිටුබලයක් ලබාගත හැකි ද යන්න සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම කෙරෙහි ද පර්යේෂකයාගේ අවධානය යොමු කරන ලදී.

## 2. සාහිත්‍ය විමර්ශනය

ආර්ථික මෙන් ම සාමාජික වශයෙන් ගත් කළ උසස් අධ්‍යාපනය සඳහා කරන වියදම ආයෝජනයක් ලෙස සැලකීම සංවර්ධනය වූ බොහෝ රටවල් අනුගමනය කරන සංකල්පයකි. මේ නිසා උසස් අධ්‍යාපනය සඳහා ලබා දෙන අධ්‍යාපනික පහසුකම් විශේෂයෙන් ම එම රටේ ආර්ථික හා සාමාජික අවශ්‍යතාවයන් හා බැඳී පැවතිය යුතු වේ. විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගෙන් බොහෝ දෙනා සුදු කරපටි රැකියාවන් බලාපොරොත්තුවීම ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීමේදී සිසුන්. තුළ රැකියා නිපුණතා වර්ධනය කරමින් සුදු කරපටි රැකියා සඳහා පමණක් බලාපොරොත්තු නබාගනු වෙනුවට තම නිපුණතාවලට ගැළපෙන





රැකියාවක් ලබාගැනීම පිළිබඳ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක්ව පවතී. ඒ සඳහා ආර්ථිකයේ විවිධ අංශයන්හි ඇති වෘත්තිමය අවස්ථා පිළිබඳ ව ශිෂ්‍ය අවධියේදීම විවිධ සමීක්ෂණ කර අවබෝධය ලබාගත හැකිවන සේ විශ්වවිද්‍යාල තුළ සිදුකරන ඉගැන්වීම් ක්‍රමවේදයන් ද ප්‍රතිසංවිධානය විය යුතු බව දැකිය හැකි ය.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වෘත්තීමය අවශ්‍යතා හා අධ්‍යාපනික වැඩ සටහන්වල සවිස්තරාත්මක අධ්‍යයනයක් සඳහා සංවර්ධිත වැඩ පිළිවෙළක් කඩිනමින් ඇති කිරීම අත්‍යවශ්‍ය බව හොමාඩි පෙන්වා දී ඇත. (Hommadi, 1990 : 69)

මේ සඳහා යොදාගත හැකි පියවර කීපයක් ඔහු පැහැදිලි කර ඇත.

1. අධ්‍යාපනික පුහුණුවීම්වල සෑම පියවරකදීම මූලික අරමුණු ශිෂ්‍යයා ස්වයං රැකියා සඳහා යොමු කිරීම විය යුතු ය.
2. අධ්‍යාපනික ආයතන හා රැකියා ආයතන අතර සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ද්විත්ව හුවමාරුවක් යටතේ දෛනික වැඩ කටයුතු සංවිධානය විය යුතු ය.
3. විවිධ විෂයයන් පිළිබඳ තාක්ෂණික නිපුණතා ලබාගත හැකි ආකාරයට අධ්‍යාපනික කටයුතු සංවිධානය කළ යුතු ය.
4. උසස් අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක වර්ධනය සීමා විය යුතු අතරම, උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා ප්‍රතිඵලදායි පියවර ගත යුතු ය. (Hommadi, 1990 : 70)

ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුළ ද, විෂයමාලාව, ඉගැන්වීම් ක්‍රම හා විභාග ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම සඳහා ප්‍රයෝජනවත් වන අදහස් හා ක්‍රියාමාර්ග ගවේෂණය කිරීම වැදගත් වේ.

### 3.1 විෂයමාලා ප්‍රතිසංවිධානය පිළිබඳ නූතන අදහස්

විෂය මාලාවක් විස්තරාත්මක ව ඉදිරිපත් කිරීමට වඩා එය ප්‍රායෝගික කිරීමේ වැදගත්කම වෝකර් (Walker, 1990) පහත දැක්වෙන පරිදි අවධාරණය කර ඇත.

1. විෂය කරුණු ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරුන් සහ ශිෂ්‍යයන් සහභාගි වීම..

2. ගුරුවරුන් ශිෂ්‍යයන් සහ වෙනත් අය වැදගත් යයි සිතන විෂය කරුණු අධ්‍යයනය කිරීම.

3. මෙම කරුණු විෂයමාලාව තුළ සංවිධානය කර ඇති ආකාරය අධ්‍යයනය.

මෙම අදහස්වලට අනුව විෂයමාලාවක් ගුරුවරුන් සහ ශිෂ්‍යයන් එක් ව ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.
Longstreet සහ Shane (1993) විෂයමාලාවට පහත සඳහන් වැදගත් මාතෘකා ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

1. සමාජ කේන්ද්‍රීය විෂය ධාරා
2. ශිෂ්‍ය කේන්ද්‍රීය විෂය ධාරා
3. දැනුම් කේන්ද්‍රීය විෂය ධාරා
4. සාරාත්මක කරුණු ඇතුළත් විෂය ධාරා (Eclectic Crriculum)

මෙවැනි විවිධ අදහස් විෂයමාලා නවීකරණය පිළිබඳ ව ඉදිරිපත් වී ඇති අතර විශේෂයෙන් ම විශ්ව විද්‍යාල මට්ටමේ විෂයමාලාවේ අර්ථාන්විත නවීකරණයක් සඳහා වැදගත්වන විවිධත්වයෙන් යුතු ප්‍රමුඛතාවලියක් (Marsh, 1999 : 8) දක්වා ඇත. ඉන් කිහිපයක් පහත දැක්වේ.

1. විෂයමාලාවේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික සංවර්ධනය අධ්‍යයනය.
2. දේශපාලන බලය සහ එම බලය පිළිබඳ ප්‍රයත්න අධ්‍යයනය.
3. පෞද්ගලික අත්දැකීම් සහ ජීවන කථා පිළිබඳ අධ්‍යයනය.
4. විෂයමාලාව පිළිබඳව ස්ත්‍රී පුරුෂ වශයෙන් ලැබෙන අවබෝධය
5. මානව සංජානන සහ අත්දැකීම් පිළිබඳ ව අවබෝධය
6. විෂයමාලාව තුළින් සෞන්දර්යාත්මක අවබෝධය
7. විෂයමාලාව තුළින් ජාතීන් පිළිබඳ අවබෝධය
8. සංස්කෘතික විවිධතා පිළිබඳ අවබෝධය
9. ක්‍රියාත්මක වන සදාචාරාත්මක සහ ආගමික විෂයමාලාව පිළිබඳ අධ්‍යයනය





විෂයමාලාව විවිධත්වයෙන් යුතු ව සංවර්ධනය වන අතර එය ප්‍රතිසංවිධානයේදී විශ්වවිද්‍යාල ගැඹුරු අවබෝධයකින් හා වගකීමකින් යුතු ව මෙම කාර්යට පිවිසීම වැදගත් බව මෙම කරුණුවලින් පැහැදිලි වෙයි.

ශිෂ්‍ය ඉගෙනුම් ක්‍රියාවලියෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම අවධාරණය කරන ග්ලැට්හෝන් (Glatthorn 1993 : 354) පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිල්ල යොමු කර ඇත.

1. අනාගතය කෙරෙහි නැඹුරුවීම.
2. සියළුම ශිෂ්‍යයන්ගේ ජයග්‍රහණ කෙරෙහි කැපවීම.
3. සමාජ වෙනස්වීම්වලට විෂයමාලා ප්‍රතිඵල අනුකූල වීම.
4. ප්‍රතිඵල අවශ්‍යතා අනුව විෂයමාලා රාමුව සැකසීම .
5. සිසුන්ට විවිධ මාර්ගවලින් ප්‍රතිඵල ලබාගත හැකි සේ විෂයමාලාව සකස් කිරීමෙන් සිසුන්ට ලැබෙන ප්‍රතිඵල එක් මාර්ගයකට සීමා නොවීම.
6. ඇගයීමේදී නිර්ණායක මූලික ක්‍රම යොදා ගැනීම.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල විෂයමාලාවේ අර්ථාන්විත නවීකරනයක් සඳහා මෙම සියළු අදහස් කෙරෙහි සැලකිලිමත්වීම වැදගත් වේ.

### 3.2 විශ්වවිද්‍යාල ඉගැන්වීම් ක්‍රම ප්‍රතිසංවිධානය

විශේෂයෙන් ම විශ්වවිද්‍යාල තුළ බහුල වශයෙන් භාවිතා වන ඉගැන්වීම් ක්‍රමය දේශන ක්‍රමයේ කාර්යක්ෂමතාව වර්ධනය සඳහා කථිකාචාර්යවරුන් ගතයුතු ක්‍රියාමාර්ග උසස් අධ්‍යාපනයේ ඉගැන්වීම් හා ඉගෙනීම පිළිබඳ ලියවුණු අත්පොතක ෆ්‍රයි කෙටරිජ් සහ මාර්ෂල් (Fry etal 2000 : 88) සඳහන් කර ඇත. එහි සම්පිණ්ඩනයක් පහත දැක්වේ.

1. දේශනයෙහි ව්‍යුහය ක්‍රමානුකූල ව සැකසීම ශිෂ්‍යයන් ලබන නව දැනුම ඔවුන්ගේ මනසෙහි මැනවින් තැන්පත් කර ගැනීමට උචිත පරිදි දේශනයෙහි සැලකිල්ල නිර්මාණය විය යුතු ය.

2. දේශනයේ අන්තර්ගත කරුණුවල සම්බන්ධතාව සහ දේශනය යොමුවන දිශාව පැහැදිලි වන පරිදි ඉදිරිපත් කරන වර්තමාන කරුණු දැනට අවසන් කර ඇති සහ අනාගතයට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන දේශනවල කරුණු අතර සබඳතා ඇති කිරීම.
3. දේශනයේ අධ්‍යාපනික පරමාර්ථ සහ බලාපොරොත්තුවන ඉගෙනුම් ප්‍රතිඵල පැහැදිලි කිරීම.
4. දේශනය තුළින් කරුණු රාශියක් ඉදිරිපත් කිරීම වෙනුවට ශිෂ්‍යයින්ට පහසුවෙන් අවබෝධ කරගෙන ක්‍රියාවට නැගිය හැකිවන පරිදි වැදගත් කරුණු සාරාංශ කර සම්පිණ්ඩනයක් ලෙස දැක්වීම. මෙම ක්‍රියාවලිය වැඩිදුර කියවීමට ශිෂ්‍යයන් පොළඹවයි.
5. ශිෂ්‍ය අවධානය වර්ධනය වන ආකාරයට විවිධත්වයෙන් යුතුව දේශනය පැවැත්වීම.
6. ආරම්භයේ සිටම ශිෂ්‍ය සහභාගිත්වය ලබාගන්නා ආකාරයට දේශන සැලසුම් කිරීම.
7. දේශනයේ අග භාගයෙහි ඉදිරිපත් කරන ලද නව කරුණු හා මුලින් ඉගෙනගත් කරුණු අතර සම්බන්ධතා ඇතිකර ගැනීමට ශිෂ්‍යයන්ට හැකිවන පරිදි ප්‍රවේශයක් සැකසීම.
8. වෙබ් අඩවි මගින් තම දේශන සටහන් සවිස්තරව ප්‍රකාශයට පත්කිරීම බොහෝ කථිකාචාර්යවරුන් අනුගමනය කරන පිළිවෙලකි. තමන්ට ප්‍රයෝජනවත් දේශන සටහන් නිර්මාණය කර ගැනීමට ශිෂ්‍යයන් උනන්දු කිරීම සඳහා සංකල්ප, සිතියම්, විසිරුණු රූප සටහන්, චින්තන සිතියම් ශිෂ්‍යයන් වෙත ඉදිරිපත් කිරීම කථිකාචාර්යවරුන්ගේ වැදගත් කාර්යභාරයකි.
9. ශිෂ්‍යයන් අතර අත් පත්‍රිකා බෙදාදීම තුළින් ද වැදගත් ප්‍රතිඵල ලබාගත හැක. සංඛ්‍යාත්මක තොරතුරු වැඩිපුර කියවිය යුතු ග්‍රන්ථ පිළිබඳ ව විස්තර ඒවායේ දැක්විය හැක.



දේශනයක් කාර්යක්ෂමව ඉදිරිපත් කිරීම තුළින් අධ්‍යයන ප්‍රතික්‍රියා ධනාත්මකව වර්ධනය කිරීමේ අවශ්‍යතාව ඉහත සඳහන් කළ කරුණු තුළින් පැහැදිලි වෙයි.

දේශනවල සාර්ථකත්වය නිර්ණය කිරීම සඳහා ශිෂ්‍ය ආකල්ප විමසීම ද මෑතක සිට අවධානය යොමු වී ඇති තවත් අංශයකි. ෆ්‍රයිගේ (Fry 2000, 92) අදහස අනුව දේශනයේ විවිධත්වය දේශන ශෛලිය උදාහරණ මගින් කරුණු පැහැදිලි කිරීම. ශිෂ්‍යයන් අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබාගැනීමට හැකිවීම ආදිය ශිෂ්‍යයන් බෙහෙවින් අගය කළ බව පැහැදිලි වෙයි.

විශ්වවිද්‍යාල ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේදී කණ්ඩායම් ක්‍රමය යොදා ගැනීමේ වැදගත්කම ගැනද ග්‍රිෆිත්ස් (Greffiths, 2000, 95) අවධාරණය කර ඇත. විශේෂයෙන් ම සාකච්ඡාවට අවස්ථාව සැලසීමෙන් ශිෂ්‍ය චින්තන ශක්තිය වර්ධනය වන බවත්. ගැටළු කේන්ද්‍රිය ඉගෙනීමට අවස්ථාව සැලසෙන බවත්. ඔහු විස්තර කර ඇත. නිදහස් ඉගෙනීමේ හා පෞද්ගලික ඉගෙනීමේ වැදගත්කම ද කොක්ස් (Cox, 1996, 59) අවධාරණය කර ඇත.

වෘත්තීය හැකියාවන් සඳහා ඉගැන්වීමට සහ ඉගෙනීමට ද විශ්වවිද්‍යාල පද්ධතියේ දොර විවර කිරීමේ වැදගත්කම වර්තමානයේ අවධාරණය වී තිබේ. වැඩ ලෝකය පන්ති කාමරයට අන්තර් ග්‍රහණය කිරීමෙන් විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව මේ අනුව පෙන්වා දී ඇත. උපාධිධාරීන් සඳහා වෘත්තීය කුසලතා වැඩ සටහන් කළමනාකරණය වැඩසටහන් හා ව්‍යාපාර කුසලතා සඳහා කෙටි කාලීන ස්ථාපන අවස්ථා සැලසීමෙන් මේ බව පැහැදිලි වෙයි. (Fry, 2000 : 125) වෘත්තීය හැකියා ලබාදීමේ අවශ්‍යතාව (Barnett 1995 : 155) වගුවක් ඇසුරින් ද පැහැදිලි කර ඇත.

අත්දැකීම් ආශ්‍රිත ඉගෙනීම් වැදගත්කම බීටි විසින් ද (Beaty 2000 : 134) අවධාරණය කර ඇත.

විශ්වවිද්‍යාල අභ්‍යන්තරයේ මෙම ඉගෙනීම් වර්ධනය කළ හැකි මාර්ග කිහිපයක් පහත දැක්වේ.

1. රසායනාගාර අත්දැකීම්
2. සමරූපණය
3. ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ගැටළු කේන්ද්‍රීය අධ්‍යයන
4. සූක්ෂම ඉගැන්වීම
5. ව්‍යාපෘති

ඉහත සඳහන් ඉගැන්වීම් ක්‍රම සියල්ලම කථිකාචාර්ය මාර්ගෝපදේශය සහ ශිෂ්‍ය අන්තර් ක්‍රියාකාරිත්වයන් තුළින් ක්‍රියාත්මක කිරීම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට අවශ්‍ය කුශලතා වර්ධනයට හේතු වේ. (Beatry , 2000 : 137)

### 3.3 විභාග ක්‍රම ප්‍රතිසංවිධානය

අධ්‍යාපන ක්‍රමය නවීකරණය කිරීමේ දී විෂයමාලා ප්‍රතිසංවිධානය පමණක් ප්‍රමාණවත් නොවේ. විෂයමාලා ප්‍රතිසංවිධානයත් ඉගැන්වීම් ක්‍රම ප්‍රතිසංවිධානයත් සමග ඇගයීම් ක්‍රමය ද ප්‍රතිසංවිධානය කිරීම අවශ්‍යය. සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටවල ඇගයීම් ක්‍රමය බොහෝ සෙයින් වෙනස්විය යුතු බව පිළිගැනේ. (Hommadi 1999 : 82) විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ සමත් අසමත් බව තීරණය කිරීම සඳහා ශ්‍රේණි ප්‍රදානය කිරීමේදී ලකුණු භාවිත කිරීම වෙනුවට ඒකීය ක්‍රමයක් යොදා ගැනීම අවශ්‍යය. විෂයයන්ට ශ්‍රේණි ප්‍රදානය කිරීම සඳහා සාකච්ඡා වී ඇති පොදු එකගතාවයන් රාශියක් ද පෙන්වා දී තිබේ.

1. විවිධ විශ්වවිද්‍යාල අතර ඇගයීම් සඳහා ඒකීය ක්‍රමයක් යොදා ගැනීම.
2. ඉගෙනුම් සිද්ධි ඇගයීම්වලදී වඩා වැඩි විශ්වසනීයභාවයක් සහිත යොදා ගැනීම.
3. විෂයයන් අතර ඇගයීම් සඳහා පොදු මිනුම් ක්‍රමයක් යොදා ගැනීම.
4. ශිෂ්‍යයන් විෂයක් තෝරා ගැනීමේදී අන්තර් සම්බන්ධතාවයක් සහිත විෂයන් තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට මගපෙන්වීම.
5. උගන්වන විෂයයන් හි උසස් ගුණාත්මක මට්ටමක් ඇති කිරීම (Hommadi 1990 : 84)

හොඳ ඇගයීම් ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ වලංගුතාව





විශ්වාසනීයතාවය හා ප්‍රායෝගික බවයි. ඇගයීම් ක්‍රමයකින් මැනීමට බලාපොරොත්තු වන දේ කුමක් වුවත් එය නිවැරදිව මැනිය හැකිනම් වලංගුතාව සහිත ඇගයීමක් ලෙස හැඳින්විය හැකිය. පවතින තත්ත්වය යටතේ ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට හැකියාව ප්‍රායෝගික ලෙස ද, ඇගයීම කවුරුන් විසින් කළ ද සමානතාවයක් සහිත ව මැනිය හැකිනම් එය විශ්වසනීයතාවය ලෙස ද හැඳින්වේ. (Hommadi 1990 : 125)

සමාසික ක්‍රමයට අනුව කාලය පුරා ම ශිෂ්‍යයන්ගේ දක්ෂතා ඇගයීමට ලක්කළ යුතු ය. තෝරාගත් වේලාවකදී නිශ්චිත ප්‍රශ්න කීපයක් මගින් ඇගයීම් කිරීමට වඩා මුළු සමාසිකය පුරා ම විවිධ ඇගයීම් ක්‍රම මගින් ඇගයීමට ලක්කළ යුතු ය. එයින් ශිෂ්‍යයාගේ විවිධ හැකියා හඳුනාගත හැකි අතර ශිෂ්‍යාට ද ඉන් වාසියක් සිදුවේ. සමාසික ක්‍රමය තුළ ශිෂ්‍යයාට මූලික වාසි දෙකක් අත්වේ.

1. වසර පුරා ම සිසුන් අධ්‍යයන කටයුතුවලට අඛණ්ඩව සහභාගිවීම.
2. ප්‍රායෝගිකව කිසිවෙක් අසමත් නොවීම.

කිසිවෙක් සමාසික ක්‍රමය තුළ අසමත් නොවන බව ඉන් අදහස් නොවේ. එක් ඇගයීමකින් අසමත්වන අයෙකුට ඉතා ඉක්මනින් තම අඩුපාඩුව සපුරා සමත්වීමට සමාසික ක්‍රමය තුළ පහසුකම් තිබෙන බව ඉන් ගම්‍ය වේ.

සමාසික ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මතුවිය හැකි ගැටළු කෙරෙහි ද අවධානය යොමු විය යුතුය. සමාසිකය ආරම්භයේදීම ඉගැන්වීම ආරම්භවීම වැදගත්ය. සමාසිකය තුළ දින කිහිපයක් වුවද ඉගැන්වීම්වලට සහභාගි නොවීම ශිෂ්‍යාගේ කාර්ය දර්ශනයට හානිකර වේ. ප්‍රමාදවී දේශනවලට සහභාගිවීම නිසා පාඨමාලාවට සූදානම් වීමට ඇති කාලය ප්‍රමාණවත් නොවන අතර අන්තර් විෂය කරුණු සම්බන්ධතාවය නොමැති නිසා දැනුම විභේදනයට ද තුඩුදිය හැකිය.

සමාසික ක්‍රමය තුළ පාඨමාලා සැලසුම් කිරීමේදී කථිකාචාර්යවරුන් ද ශිෂ්‍ය සහභාගිත්වය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. සෑම අත්දැකීමක්ම ශිෂ්‍යයාට ලබාදිය හැකිවන සේ ගුරුවරයා ද එම අත්දැකීම් උකහා ගැනීම වැදගත් ය. සමාසික ක්‍රමයේදී නම්‍යශීලිත්වය ද වැදගත්වේ. මෙහිදී සුදුසු කාලසටහනක් ලබාදීම අසීරු වන නමුත් පාඨමාලාවේ විවිධ කොටස් සඳහා ශිෂ්‍යයන්ට සහභාගි විය හැකි වනසේ


කාලසටහන සකස් කිරීම ඉතා වැදගත් වේ.

මෙම අදහස් තුළින් ඉතා පැහැදිලි ව අනාවරණය වන කරුණක් නම් විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතිය තුළ විෂයමාලාව. ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ක්‍රම ප්‍රතිසංවිධානය වීම තුළින් සමාසික ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි බවයි.

## 4. ක්‍රමවේදය

සමාසික ක්‍රමය පිළිබඳ අදහස් ලබාගැනීමේදී ප්‍රධාන වශයෙන් සමීක්ෂණ ක්‍රමවේදය භාවිත කරන ලදී. ඒ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ දෙපාර්තමේන්තු 10 ක අවසන් වසරේ අධ්‍යයන කටයුතුවල නිරත ශිෂ්‍යයන් 300 ක් අහඹු නියැදිකරණය මගින් නියැදිය සඳහා තෝරාගන්නා ලදී. ශිෂ්‍ය අදහස්වලට අමතරව ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් කථිකාචාර්ය වරුන්ගෙන් ද අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගන්නා ලදී. ශිෂ්‍ය නියැදිය සඳහා තෝරාගත් දෙපාර්තමේන්තු 1.0 රූප සටහනෙන් දැක්වේ.

1. රූපය :- ශිෂ්‍ය නියැදි විශ්ලේෂණය




ශිෂ්‍යයන් සඳහා ප්‍රශ්නාවලියක් භාවිත කරන ලද අතර නියැදියෙන් 70% ක් හෙවත් 210 ක් ප්‍රතිචාර දක්වන ලදී.

කථිකාචාර්යවරුන් වෙත ද ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන ලද අතර ඒ. ඇසුරින් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදී.

ශිෂ්‍ය නියැදියෙන් ලබාගත් තොරතුරු විෂයමාලා, ඉගැන්වීම් ක්‍රමය යන අංශ ආශ්‍රිත ව විශ්ලේෂණය කරමින් නිගමනවලට එළඹීම සිදුකරන ලදී.






## 5. දත්ත විශ්ලේෂණනය හා අනාවරණ

### 5.1 ශිෂ්‍ය ආකල්ප

සමාසික ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව මේ වන විට අවසන් වසරේ සිසුනට යම් අත්දැකීම් ප්‍රමාණයක් ලැබී තිබේ. ශිෂ්‍යන්ට දෙන ලද ප්‍රශ්නාවලියට එම අත්දැකීම් පදනම්කර ගෙන ප්‍රතිචාර ලැබුණු අතර එම ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමේදී වැදගත් අනාවරණ කීපයක් හඳුනාගත හැකි විය. එම කරුණු 2.0 රූප සටහන මගින් දක්වා තිබේ.

2.0 රූප සටහන :- සමාසික ක්‍රමය පිළිබඳ ශිෂ්‍ය ආකල්ප



ප්‍රශ්නාවලිය මගින් ශිෂ්‍යයන්ගෙන් ලැබුණු ප්‍රතිචාරවල සාරාංශයන් ඉදිරි වගු මගින් දක්වා තිබේ.

1.0 වගුව : විෂයමාලාව පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිචාර

| | | ඔව් % | නැත% |
|---|---|---|---|
| 1. | පාඨමාලාව ආරම්භයේදී අනුගමනය කරන විෂයයන් පිළිබද ශිෂ්‍ය කැමැත්ත විමසා බැලේ | 34 | 66 |
| 2. | ඉගෙන ගන්නා විෂයයන් ශාස්ත්‍රීය පැත්තට නැඹුරුය | 74 | 26 |
| 3. | අනාගතයේදී රැකියා ලබාගැනීමට ප්‍රයෝජනවත් විෂය ඉගෙනීමට අවස්ථාව ලැබේ. | 26 | 74 |
| 4. | පරිගණක විෂය ඉගෙනීමට අවස්ථාව ලැබේ. | 05 | 95 |
| 5. | ඉංග්‍රීසි විෂය ඉගෙනීමේදී ඉංග්‍රීසියෙන් කථා කිරීමට අවස්ථාව ලැබේ. | 30 | 70 |
| 6. | සෞන්දර්ය විෂයයන් ඉගෙනීමට අවස්ථාව ලැබේ. | 23 | 77 |
| 7. | අර්ත රහිත පාඨමාලා හැදෑරීමට කැමැත්තක් දක්වමි. | 64 | 36 |





2.0 වගුව : විෂයමාලාව නවීකරණය පිළිබඳ ශිෂ්‍ය ආකල්ප

| | | එකඟ වෙමි | කිව නොහැක | එකඟ නොවෙමි |
|---|---|---|---|---|
| 1. | පාඨමාලාවක් ආරම්භයේදී ශිෂ්‍ය කැමැත්තට අනුරූපව විෂයයන් තෝරා ගැනිමට පහසුකම් සැලසීම සුදුසුය. | 96 | 2 | 2 |
| 2 | රැකියා ආයතන හා සම්බන්ධ ඉගෙනීමට අවස්ථා ලබාදීම ඉගෙනීමට රුකුලක් වේ. | 94 | 4 | 2 |
| 3. | රැකියා ආයතන හා සම්බන්ධ වී විෂයයන් ආශ්‍රිත ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම අගය කරමි. | 97 | - | 3 |
| 4. | පරිගණක විෂය ප්‍රායෝගිකව ඉගෙනීමට අවස්ථාව සුලබ කිරීම අගය කරමි. | 99 | 1 | - |
| 5. | ඉංග්‍රීසි විෂය ඉගෙනීමේ දී වැඩිපුර ඉංග්‍රීසියෙන් කථා කිරීමට අවස්ථාව ලබාදීම සුදුසු ය. | 99 | - | - |
| 6. | සෞන්දර්ය විෂයයන් ඉගෙනීමට අවස්ථා පුළුල් කිරීම උචිතය. | 84 | 14 | 2 |
| 7. | කාර්මික නිෂ්පාදන පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම ස්වයං රැකියාවකට ප්‍රයෝජනවත්ය. | 67 | 25 | 8 |
| 8. | කෘෂිකාර්මික විෂයයන් ඉගෙනීමට අවස්ථා සැපයීම ප්‍රයෝජනවත්ය. | 70 | 23 | 1 |
| 9. | සෞඛ්‍ය විභාග පිළිබඳ දැනුමක් වෛද්‍ය පීඨ කථිකාචාර්යවරුන්ගෙන් ලබාදීම සුදුසුය. | 87 | 9 | 4 |

## 3.0 ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ශිෂ්‍ය ආකල්ප

| | | ඔව් | නැත |
|---|---|---|---|
| 1. | ඉගැන්වීමේ දී දේශන ක්‍රමය බහුලව යොදා ගනී | 92 | 08 |
| 2. | දේශනය අවසානයේදී සාකච්ඡාවට අවස්ථාව ලැබෙන්නේ කලාතුරකිනි. | 77 | 23 |
| 3. | බාහිර දේශකයන්ගේ දේශනවලට සවන්දීමට අවස්ථාව ඇත. | 22 | 78 |
| 4. | පෞද්ගලික ආයතනවල සේවා කටයුතු නිරීක්ෂණයට අවස්ථාව සැලසේ. | 01 | 99 |
| 5. | විශ්වවිද්‍යාල අවට ප්‍රජාවෙන් අත්දැකීම් ලබාගැනීමට අවස්ථාව ලැබේ. | 10 | 90 |
| 6. | ක්ෂේත්‍ර අධ්‍යයනවල නිරතවී පර්යේෂන වාර්තා සැකසීමට අවස්ථාව ඇත. | 52 | 48 |
| 7. | කණ්ඩායම් ව්‍යාපෘති වශයෙන් ප්‍රදර්ශනය සංවිධානයට අවස්ථාව ඇත. | 23 | 77 |
| 8. | සම්මන්ත්‍රණවල සිය අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබේ. | 38 | 62 |
| 9. | මාතෘකා ආශ්‍රිත සමූහ අනාවරණ සඳහා වාද විවාද පැවැත්වීමට අවස්ථාව සැලසේ. | 20 | 80 |

### 4.0 ඉගැන්වීම් ක්‍රමය සංවර්ධනය පිළිබඳ ශිෂ්‍ය අදහස්

| | | එකඟ වෙමි | කිව නොහැක | එකඟ නොවෙමි |
|---|---|---|---|---|
| 1. | දේශන ක්‍රමයට කැමැත්තක් දක්වමි | 83 | 10 | 7 |
| 2. | දේශන අවසානයේ සාකච්ඡා කිරීමට අවස්ථාව සැලසීම යෝග්‍ය වේ. | 99 | 1 | - |
| 3. | ගුරු ශිෂ්‍ය සම්බන්ධතා ඇසුරෙන් සම්මන්ත්‍රන මගින් ශිෂ්‍යයන් කැමති විෂයාශ්‍රිත මාතෘකාවක් පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම උචිත ය. | 95 | 3 | 2 |





| | | | | |
|---|---|---|---|---|
| 4. | වැදගත් විෂය මාතෘකාවක් අවසානයේ වැඩමුළු සංවිධානය විෂයය කරුණු පුළුල් කර ගැනීමට හේතුවේ. | 92 | 2 | 6 |
| 5. | බාහිර දේශකයන්ගේ දේශනවලට සවන්දීමෙන් අමතර දැනුම වර්ධනය වේ. | 91 | 6 | 3 |
| 6. | පෞද්ගලික ආයතනවල සේවා කටයුතුවල අර්ධකාලීනව නිරතවීමෙන් අනාගත රැකියා පිළිබඳ පෙරහුරුවක් ලැබේ. | 92 | 7 | 1 |
| 7. | අවට ප්‍රජාවේ ජීවන කටයුතු හා සම්බන්ධ වී රැකියා ක්ෂේත්‍ර පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට අවස්ථා සැලසීම යෝග්‍ය වේ. | 80 | 17 | 3 |
| 8. | ශිෂ්‍ය හැකියාව ආශ්‍රිත ප්‍රදර්ශන සංවිධානයෙන් ස්වයං නිෂ්පාදන සඳහා පෙළඹවීමක් ඇතිවේ. | 80 | 17 | 3 |
| 9. | ඉගෙන ගන්නා විෂයයන් ආශ්‍රිත පොත් ප්‍රකාශනයට ශිෂ්‍යයන්ට අවස්ථාව සැලසීමෙන් නිර්මාණාත්මක හැකියාව දියුණු වේ. | 90 | 9 | 1 |
| 10. | මාතෘකා ආශ්‍රිත අමතර කරුණු අනාවරණය සඳහා වාද විවාද පැවැත්වීමට සැලසීම සුදුසුය. | 84 | 12 | 4 |

| | 5.0 ඇගයීම් ක්‍රමය පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිචාර | ඔව් | නැත |
|---|---|---|---|
| 1. | සමාසික පරීක්ෂණයේදී ග්‍රන්ථ පරිශීලනය කර පිළිතුරු සැපයීම සුදුසු ය. | 60 | 40 |
| 2. | පැවරුම් සඳහා 20% ප්‍රතිශතයක් එකතු කිරීම සුදුසුය | 88 | 12 |
| 3. | විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් උත්තර පත්‍ර ලකුණු කිරීම සුදුසු ය. | 83 | 17 |
| 4. | පරිගණක විෂය ඇගයීමට ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සුදුසු ය. | 28 | 72 |
| 5. | ඉංග්‍රීසි කථනයට ලකුණු පිරිනැමීම සුදුසු ය. | 9 | 91 |
| 6. | සමිති සමාගම්වල කටයුතු සඳහා ශ්‍රේණි පිරිනැමීම සුදුසුය. | 5 | 95 |

6.0 ඇගයීම් ක්‍රමය ප්‍රතිසංවිධානය පිළිබඳ ශිෂ්‍ය ආකල්ප

| | එකඟ වෙමි | කිව නොහැක | එකඟ නොවෙමි |
|---|---|---|---|
| 1. අවසාන ලිඛිත පරීක්ෂණය සඳහා 60% ක ලකුණු පිරිනැමීම සුදුසු ය. | 88 | 6 | 6 |
| 2. සමාසික අවසාන පරීක්ෂණය පැය 02 ක ලිඛිත පරීක්ෂණයකට පමණක් සීමාවීම සුදුසු ය. | 77 | 8 | 15 |
| 3. මධ්‍ය සමාසික පරීක්ෂණය මගින් සති 07 ක් තුළ ලබාගත් විෂය ආශ්‍රිත දැනුම ඇගයීම උචිත ය. | 70 | 10 | 20 |
| 4. මධ්‍ය සමාසික පරීක්ෂණය මගින් පැයක ප්‍රශ්න පත්‍රයකට ලිඛිතව පිළිතුරු සැපයීම උචිතය | 71 | 8 | 21 |
| 5. මධ්‍ය සමාසිකයේ ලකුණු අවසාන සාමාසික පරීක්ෂණයට පෙර ලබාදීම සුදුසු ය. | 91 | 6 | 3 |
| 6. මධ්‍ය සමාසිකය සඳහා 20% ක ලකුණු ප්‍රතිශතයක් එකතු කිරීම උචිතය. | 80 | 8 | 12 |
| 7. දෙවෙනි සමාසිකය පටන් ගැනීමට පෙර පළමු සමාසිකයට අයත් ශ්‍රේණි ලක්ෂ සාමාන්‍ය (G. P. A) ලබාදීම උචිත ය. | 90 | 6 | 3 |
| 8. අර්ධ සමාසික පරීක්ෂණයේ දී සම්මුඛ සාකච්ඡා මණ්ඩලයක් මගින් ශිෂ්‍ය දැනුම ඇගයීම සුදුසුය. | 65 | 20 | 15 |
| 9. අර්ධ සමාසික පරීක්ෂණයට ලියන අවස්ථාවේ ග්‍රන්ථ පරිශීලනයට අවස්ථාව සැලසීම විවේචනාත්මක චින්තනය වර්ධනයට හේතුවේ. | 59 | 31 | 10 |
| 10. පැවරුම් සඳහා 20% ක ලකුණු ප්‍රතිශතයක් එකතු කිරීම උචිතය. | 83 | 7 | 10 |
| 11. පැවරුම් සඳහා පිරිනමන ලකුණු අවසාන සමාසික පරීක්ෂණයට පෙර ලබාදීම සුදුසුය. | 97 | 2 | 1 |
| 12. පැවරුම් විෂමතා වැළැක්වීම සඳහා වැදගත් මාතෘකා ඇතුළත් සැලැස්මක් ලබාදිම සුදුසු ය. | 90 | 5 | 5 |
| 13. බාහිර විශේෂඥයන් මගින් ද ඇගයීම උචිත ය. | 79 | 12 | 9 |
| 14. පරිගණක ප්‍රායෝගිකව අගයකර පිරිනමන ශ්‍රේණිය සහතිකයේ සඳහන් කිරීම සුදුසු ය. | 94 | 3 | 3 |
| 15. ඉංග්‍රීසි කථනය දියුණු කිරීම සඳහා යම් ලකුණු ප්‍රතිශතයක් ලබාදී එය සහතික පතේ ඇතුළත් කිරීම සුදුසු ය. | 93 | 5 | 2 |
| 16. සමිති සමාගම්වල ක්‍රියාශීලි ව කටයුතු කරන ශිෂ්‍යයන් සඳහා ශ්‍රේණි පිරිනමා එය සහතිකපත් ඇතුළත් කිරීම සුදුසු ය. | 67 | 17 | 16 |





ප්‍රශ්නාවලිය සඳහා ශිෂ්‍යයන් ඉදිරිපත් කළ ප්‍රතිචාර සංඛ්‍යාත්මක ව විග්‍රහ කිරීමේදී සමාසික ක්‍රමයප්‍රති සංවිධානය විය යුතු ය. යන අදහස වැඩි ප්‍රතිශතයක් පිළිගන්නා බව ඉහත සඳහන් කළ සංඛ්‍යාත්මක වගු තුළින් මැනවින් පැහැදිලි වෙයි. විෂයමාලාව, ඉගැන්වීම් ක්‍රම සහ ඇගයීම් ක්‍රම යන අංශ අනාගතයේදී ප්‍රතිසංවිධානය කිරීම සඳහා වැදගත්වන මූලික කරුණු පිළිබඳවත් ශිෂ්‍ය ප්‍රතිචාරවලින් තොරතුරු හෙළි විය.

ශිෂ්‍ය කියැඳීයෙන් ඉදිරිපත් වූ අදහස් කීපයක් පහත 7.0 වගුවෙන් දැක්වේ.

7.0 වගුව සමාසික ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය අදහස්

විෂය මාලාව
- ❖ සමාසික වැඩ සටහන් පාඨමාලාව ආරම්භයේදීම ලබාදීම.
- ❖ සමාසිකය ආරම්භයේදීම සෑම විෂයකම විෂය නිර්දේශය ලබාදීම.

- හදාරණ ඇතැම් විෂයයන් අදාල අධ්‍යයන කාලයට පමණක් සීමාවන ප්‍රායෝගික හෝ අලුතින් දැනුම එකතුවීම නොවන ඒවා ය. වර්තමාන තත්ත්වයට ගැළපෙන වඩා වැඩි ප්‍රායෝගික වැදගත්කමක් සහිත විෂයයන් ඉගැන්වීම උචිත ය.
- වෛකල්පිත විෂයයන් ඉගෙනීමට අවස්ථා වැඩි කිරීම, සංඛ්‍යානය,තොරතුරු තාක්‍ෂණය, ගෝලීයකරණය, අධ්‍යාපන මනෝවිද්‍යාව, ලිංගික අධ්‍යාපනය ආදි විෂයයන් ශිෂ්‍යය අවශ්‍යතා අනුව තෝරා ගැනීමට ඉඩ ලබාදීම.

**ඉගැන්වීම් ක්‍රම**

- කථිකාචාර්යවරුන්ට ඉගැන්වීම් ක්‍රම පිළිබඳ සේවාස්ථ පුහුණුවක් ලබාදීම.
- මනා සැලැස්මකට හා සූදානමකට අනුව දේශන පැවැත්වීම.
- සාකච්ඡා ක්‍රම මගින් වැඩි වැඩියෙන් ශිෂ්‍යයන් දේශනය හා සම්බන්ධ කර ගැනිම යෝග්‍යය.
- නව පාඩමක් ආරම්භ කිරීමේදී එයට අදාල අත් පත්‍රිකා දේශනය මුල්දී ලබාදීම.
- ශිෂ්‍යයන් පෞද්ගලික ආයතනවලට අනුයුක්ත කිරීමෙන් වෘත්තීය පුහුණුවක් ලබාදීම.

**ඇගයීම් ක්‍රමය**

- මධ්‍ය සමාසික දින තීරණය කිරීමේදී ශිෂ්‍යයන්ට සූදානම් වීමට අවස්ථාව ලබාදීම.
- පාඨමාලා ඒකක ක්‍රමය තුළ සමාසිකව අඛණ්ඩ ඇගයීම් දෙකක් වෙනුවට එකක් කිරීම වඩා උචිත ය.
- පරීක්‍ෂණවලදී ඇතිවන පුද්ගලබද්ධ බව වලක්වාලීම සඳහා ඇගයීම් මණ්ඩලයක් මගින් ඇගයීම් කිරීම.





- සමාසික පරීක්‍ෂණ හා පැවරුම් ලකුණු ශිෂ්‍යයන්ට ඉක්මනින් ලබාදී ඒවායේ අඩුපාඩු සාකච්ඡා කිරීම.
- ලියාපදිංචි අංක වෙනුවට ශිෂ්‍යයන්ට විභාග සඳහා වෙන ම අංක ලබාදීම.

සමාසික ක්‍රමය යටතේදී එක් විෂයයන් සඳහා වෙන්කර ඇති පැය තුනෙන් පැයක කාලයක් සාකච්ඡා සඳහා යොදාගැනීම සුදුසු බවත් එබඳු වැඩපිළිවෙළක් දැනට ක්‍රියාත්මක නොවන බවත් ශිෂ්‍යයන් ප්‍රකාශ කර ඇත. ශිෂ්‍යයින් ද සහභාගි කරගෙන ප්‍රශ්නකරණයට ඉඩ ලබාදී මෙම පැය තුළ සාකච්ඡා කිරීම තුළින් විෂය අඩුපාඩු සකස්කර ගත හැකිවාක් මෙන් ම ගුරු සිසු සබඳතාවය ද සුහද මට්ටමකින් වර්ධනය කරගත හැකිවනු ඇත.

විශ්වවිද්‍යාලය තුළ විභාග පිළිබඳ ව දැඩි මානසිකත්වයක් ඇතිවී තිබෙන බව ද ශිෂ්‍යයන් ප්‍රකාශ කර තිබේ. පැවරුම්, මධ්‍ය සමාසික පරීක්‍ෂණ අධික නිසා ශිෂ්‍යයන් මානසික කඩා වැටීමකට ද ලක්වී ඇතැයිද ශාස්ත්‍ර පීඨය තුළ විවිධ ගැටුම් ඇතිවීමෙහිලා එයද හේතුවක් වී ඇතැයිද ප්‍රකාශ කරන ලදී.

ඒ ඒ විෂයයන් සඳහා ලබාදෙන පැවරුම් කොපි කිරීම විශාල වශයෙන් ශාස්ත්‍ර පීඨය තුළ සිදුවන බව ශිෂ්‍යයන් ප්‍රකාශ කරන ලදී. කථිකාචාර්යවරුන්ගේ ඇගයීම් නිසි පරිදි සිදු නොවන නිසා එකම පැවරුම් කොපි කර ලිවූ දෙදෙනකුගෙන් එක් අයෙකුට A ලැබෙන අතර අනෙක් අයට B ලැබෙන බවත්. ඇතැම් ශිෂ්‍යයන් සඳහන් කර ඇත. ඒ නිසා පැවරුම් ලකුණු අවසාන විභාගයේදී සමාර්ථය තීරණය කිරීමේදී සැලකිල්ලට ගැනිම තුළින් ශිෂ්‍යයන්ට අසාධාරණයක් වන බවද පෙන්වා දී ඇත.

වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක වන ප්‍රවණතා හඳුනාගෙන ඒ අනුව විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතියද වෙනස්විය යුතු බව ශිෂ්‍යයන්ගේ අදහස විය. විශේෂයෙන් අනිකුත් සරසවි හා සැසඳීමේදී පේරාදෙණිය

විශ්වවිද්‍යාලය පාරම්පරික දැනුම පමණක් බෙදා දෙන වදවී යන සත්වයෙක් ලෙස හඳුන්වා දී තිබේ. ජයවර්ධපුර හා කොළඹ විශ්වවිද්‍යාලවල සිසුන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය හඳුන්වනුයේ "පේරාදෙණිය යනු වදවී ගෙන යන ඩයිනෝසිරස් කෙනෙකි" යනුවෙනි. මෙම අවමානයෙන් මිදී නව ලොවට සාර්ථකව මුහුණ දෙමින් ඉදිරියට යාම සඳා සමාසික ක්‍රමය තුළින්වත් පිටුබලයක් ලබා ගත යුතුය යන්න ශිෂ්‍යයන්ගේ අදහසයි. එසේ නොවුන හොත් "පේරාදෙණිය සරසවිය වදවී ගෙන යන සතෙකු වැනි ය" යන අදහස සනාථ කරන සාධකයක් වනු ඇත.

## 5.2 සමාසික ක්‍රමය පිළිබඳ කථිකාචාර්ය ආකල්ප

සමාසික ක්‍රමය වඩා ඵලදායී අධ්‍යාපන ක්‍රමයක් කරගනු සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරවමින් කථිකාචාර්යවරුගේ අදහස් ද ලබාගන්නා ලදී. මෙහිදී ශිෂ්‍යයන් ඉදිරිපත් කළ අදහස් පිළිබඳව ද ඔවුන් බොහෝ දුරට එකගතාවය දැක්වූ අතර ශිෂ්‍යයන්ගේ යෝජනා යුක්ති සහගත බව ද පිළිගන්නා ලදී. සමාසික ක්‍රමය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලවල දර්ශනය හා යෝජනා 8.0 වගුවෙන් නිරූපණය කර තිබේ.

8.0 වගුව සමාසික ක්‍රමය පිළිබඳ කථිකාචාර්ය ආකල්ප

| | |
|---|---|
| විෂය මාලාව | ❖ සෑම සමාසිකයක් ආරම්භයේදීම එම සමාසිකයේ සැලසුම් ශිෂ්‍යයන්ට ලබාදීම. |
| | ❖ අධ්‍යයන වර්ෂය ආරම්භයේදී ඒ ඒ දෙපාර්තමේන්තුවල විෂය නිර්දේශ ඇතුළත් අත්පොතක් ලබාදීම. |
| | ❖ විෂය අන්තර්ගතය පිළිබඳ විමර්ශනය කර යළි සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් කමිටු පත් කිරීම. |





| | |
|---|---|
| | ❖ කථිකාචාර්යවරුන් සිය දේශන ගුණාත්මක වටිනාකමක් සහිතව සූදානම් කර ගැනීම. |
| | ❖ වෛකල්පිත විෂයයන් වැඩි සංඛ්‍යාවක් ඉගෙනීමට අවස්ථාව ලබාදීම, සංඛ්‍යානය, තොරතුරු තාක්ෂණය, ගෝලීයකරණය, අධ්‍යාපන මනෝවිද්‍යාව. ලිංගික අධ්‍යාපනය වැනි විෂයයන් ඉගෙනීම සඳහා අන්තර් දෙපාර්තමේන්තු හෝ අන්තර් පීය සම්බන්ධීකරණයක් ඇති කිරීම. |
| ඉගැන්වීම් ක්‍රම | ❖ නිවාඩු කාලවලදී තාවකාලික කථිකාචාර්යවරුන් සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් මගින් ඉගැන්වීම් ක්‍රම පිළිබඳව පුහුණු වැඩමුළු පැවැත්වීම. |
| | ❖ ලියා ගැනීම සඳහා සටහන් කියවීම වෙනුවට කුඩා ශිෂ්‍ය කණ්ඩායම් සහිත පන්තිවලට ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදා අන්තර් ක්‍රියාකාරිත්වය සහිත ක්‍රියාකාරකම් තුළින් දේශන පැවැත්වීම. |
| | ❖ දේශනය ආරම්භයේදී දේශකයේ අඩංගු කරුණු පිළිබඳ ව සාරාංශයක් සහිත අත් පත්‍රිකාවක් ලබාදීම. |
| | ❖ දේශන අවස්ථාවේදී ශිෂ්‍යයන්ට මතුවන ගැටළු පිළිබඳ ප්‍රශ්න ඇසීමට අවස්ථා ලබාදීම. |
| | ❖ ක්ෂේත්‍රය තුළින් ප්‍රායෝගික දැනුම ලබාගැනීමට අවස්ථා ලබාදීම. |
| ඇගයීම් ක්‍රම | ❖ මධ්‍ය සමාසික පරීක්ෂණය සඳහා සූදානම් වීමට ප්‍රමාණවත් කාලයක් ලබාදීම. |

- පැවරුම් සංඛ්‍යාව අඩුකර, ඒ වෙනුවට වැදගත් මාතෘකා ආශ්‍රිත කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාව වැඩි කිරීම.
- කථිකාචාර්යවරුන්ගේ කාර්යභාරය අධික නොවන සේ ඇගයීම් ක්‍රමය නවීකරණය කිරීම.
- ලකුණු කරන ලද පැවරුම් ආපසු ශිෂ්‍යයන්ට ලබාදීම.
- මධ්‍ය හා අවසාන සමාසික පරීක්ෂණ සඳහා ශිෂ්‍යයන්ට වෙනම විභාග අංකයක් ලබාදීම.

කථිකාචාර්ය නියැදියේ සමාජිකයන්ගේ අදහස් අනුවද පරිගණක හා තොරතුරු තාක්ෂණය පිළිබඳව ශිෂ්‍යයන්ගේ දැනුම ප්‍රවර්ධනය උදෙසා විෂයමාලා සංශෝධනය කිරීම යුගයේ අවශ්‍යතාවයක් බව අනාවරණය විය. එමෙන් ම සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීම සඳහා විධිමත් ක්‍රමයක් සැලසුම් කළ යුතු බව ද කථිකාචාර්යවරුන් ප්‍රකාශ කරන ලදි. ඒ සඳහා ඉංග්‍රිසි මාධ්‍යයෙන් දේශන කිහිපයක්වත් සංවිධානය කිරීම එක් උපක්‍රමයක් බව ද පෙන්වා දෙන ලදී. ශිෂ්‍යයන්ගේ මෙන් ම රටේ ද අනාගත අපේක්ෂා ඉටුවන අයුරින් පාඨමාලා ප්‍රතිසංවිධානය කිරීම කාලීන මෙන්ම හදිසි අවශ්‍යතාවයක් බවද කථිකාචාර්යවරුන්ගේ පිළිගැනීම විය.

## 6. නිගමන හා යෝජනා

### 6.1 නිගමන

සමාසික ක්‍රමය පිළිබඳ ව ශිෂ්‍යයන් තුළ තවමත් පැහැදිලි අවබෝධයක් නොමැති බව දක්නට ලැබිණි. එම නිසා පළමුවෙන් ම ශිෂ්‍යයන්ට මෙම සමාසික ක්‍රමයේ පදනම සහ එය ක්‍රියාත්මක වන ආකාරය ද ඉන් අත්වන ප්‍රතිලාභ ආදිය ද පිළිබඳව පුළුල් දැනුමක් ලබාදීම අවශ්‍ය බවට නිගමනය කළ හැකි ය.





ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා රජය විශාල මුදලක් වාර්ෂික ව ආයෝජනය කරයි එසේ වුවත් විශ්වවිද්‍යාලවලින් පිටවන උපාධිධාරීන්ගෙන් ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය ඉතා අල්ප බව පැහැදිලි ය. රැකියා වියුක්ති උපාධිධාරීන්ගේ ශ්‍රමය දැනුම හා කුශලතා කිසිදා ප්‍රයෝජනයකට නොගෙන පවතින තත්ත්වයක් දැකිය හැකි ය. එම නිසා විශ්වවිද්‍යාල උපාධිධාරීන් රැකියා වෙළඳපොළ තුළට අන්තර්ග්‍රහණය කළ හැකිවන සේ විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමය හා විශ්වවිද්‍යාල පාඨමාලා ප්‍රතිසංවිධානය වීම ඉතා අවශ්‍ය ය. විශේෂයෙන් සමාසික ක්‍රමය යටතේදීවත් දේශන තුළින් සාම්ප්‍රදායික දැනුම සම්ප්‍රේෂණය කරනු වෙනුවට ශිෂ්‍යයන් තුළ ප්‍රායෝගික කුශලතා වර්ධනය කරවීම බෙහෙවින් වැදගත් මෙන්ම අවශ්‍ය කටයුත්තක් බවද කිව හැකි ය.

විශ්වවිද්‍යාල තුළ සමාසික ක්‍රමය යටතේ කේන්ද්‍රීය බව තවත් වර්ධනය වී ශිෂ්‍යයන් තුළ විභාග භිතිකාවන් ගොඩනැගී ඇතැයි ශිෂ්‍යයන් පළ කළ මතය විය. එයට හේතුව මධ්‍ය සමාසික පරීක්ෂණ, පැවරුම් නිබන්ධන ආදිය කෙරේ ශිෂ්‍යයන් වැඩි වැඩියෙන් යොමුකර තිබීම ය. එම මතය දුරලා ශිෂ්‍යයන්ට නිදහසේ අධ්‍යාපනය ලබමින් පර්යේෂණ හා ගවේෂණ කටයුතුවල නිරත වෙමින් නව දැනුම සොයා යාමට මං විවර කළ යුතු බව පැහැදිලි ය. ඒ සඳහා ඇගයීම් ක්‍රමය ද ප්‍රතිසංවිධානය විය යුතු බව අනාවරණය විය.

ශිෂ්‍යයන් පවසන ආකාරයට විශ්වවිද්‍යාල බාහිර සමාජයෙන් වෙන්වූ හුදෙකලා ආයතන බවට පත්වී තිබේ. බොහෝ කථිකාචාර්යවරුන් අවට සමාජය පිළිබඳ ව නිද්‍රාශීලි ව සිටින හෙයින් නව වෙනස්වීම්වලට හැඩ ගැසීමට අකමැත්තක් දක්වන බවද අනාවරණය විය.

විශ්වවිද්‍යාල තුළ කෙරෙන ඇගයීම් පිළිබඳව ද ශිෂ්‍යයන්ගෙන් විවිධ විවේචන එල්ල විය. එනම් පැවරුම් කොපිකර ලියා භාර දුන්විට එයට විවිධ ලකුණු හිමිවීම උදාහරණ ලෙස ඔවුන් දක්වන ලදී. එම නිසා ශිෂ්‍යය පැවරුම් ශිෂ්‍ය ඉදිරිපත් කිරීම ලෙස ක්‍රියාත්මක කිරීමටත්,

ඒවා ඇගයීම් මණ්ඩලයක් මගින් ලකුණු කිරීමටත් යෝජනා කරන ලදි. ඇගයීම් ලකුණු ඊළග සමාසිකයට පෙර ලබාදීමේ වැදගත්කම ද මෙම අධ්‍යයනය තුළින් අනාවරණය විය.

## 6.2 යෝජනා

දැනට පවතින සමාසික ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීමේදී ප්‍රයෝජනවත් විය හැකි යෝජනා කීපයක් ඉදිරිපත් කිරීම මෙම කොටසේ අරමුණු වේ. බෙහෝ විදේශීය රටවල ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වන අතර ඒ තුළින් උසස් අධ්‍යාපනය ක්ෂෙත්‍රයට උපරිම ප්‍රතිලාභ හිමිකරගෙන තිබේ. එම නිසා ලංකාවෙහි ද මෙම ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි විය යුතු වන අතර සමාසික ක්‍රමය ලංකාවේ පරිසර අවශ්‍යතාවයන්ට යෝග්‍ය වන ආකාරයට ප්‍රතිසංවිධානය කර ගැනීම අවශ්‍ය වේ. පිටරටවල ක්‍රියාත්මක වන අකෘති ඒ ආකාරයට ම ලංකාව තුළ ද ක්‍රියාත්මක කිරීමට යාම නිසා විවිධ ගැටළු මතුවී තිබෙන බව ලංකාවේ ක්‍රියාත්මක වී ඇති ඇතැම් අධ්‍යාපනික මෙන්ම ආර්ථික හා සාමාජීය ප්‍රතිසංස්කරණවලදී ද දැකිය හැකිවිය.

සමාසික ක්‍රමය ප්‍රතිසංස්කරණයෙහිලා ඉදිරිපත් කරන යෝජනා කිහිපයක් පහත දැක්වේ.

1. විෂයමාලා සැලසුම්කරණයේදී ශාස්ත්‍ර පීඨයේ විවිධ දෙපාර්තමේන්තු ප්‍රධානින්ගෙන් සමන්විත කමිටුවක් මගින් ශිෂ්‍ය අදහස් ද කථිකාචාර්ය අදහස් ද විමසා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඉතා සැලකිල්ලෙන් ක්‍රියාත්මක කිරීම අවශ්‍යය එම කාර්ය සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත්කර ගත යුතු අතර, එම කමිටුව සමාජීය වෙනස්වීම්, හා අවශ්‍යතා පිළිබඳ ව විමසිල්මත් වෙමින් අවශ්‍ය වෙනස් කිරීම් සිදුකළ යුතු ය.
2. සමාජ අවශ්‍යතා සැලකිල්ලට ගෙන එම අවශ්‍යතාවලට ගැළපෙන ආකාරයට පාඨමාලා සැකසීම අවශ්‍යය. ශාස්ත්‍රීය





අධ්‍යාපනයට අමතරව වෘත්තීය, නිපුණතා ලබාගත හැකිවන ආකාරයට පාඨමාලා නවීකරණය කිරීම හා නව පාඨමාලා හඳුන්වා දීම වැදගත් ය. උදාහරණයක් ලෙස සිංහල දෙපාර්තමේන්තුවට එහි ශාස්ත්‍රීය විෂයයන් වලට අමතර ව, නාට්‍ය රචනය හා නිෂ්පාදනය, පුවත්පත් වාර්තාකරණය, ගීත රචනය වැනි වෘත්තීය කේන්ද්‍රීය විෂයයන් ද සිය විෂය මාලාවට ඇතුළත් කළ හැකි ය.

3. ශිෂ්‍යයන්ට ප්‍රජාව හා සම්බන්ධ අත්දැකීම් ලබා ගැනීමට අවස්ථා ලබාදීම අවශ්‍යය දැනට ශිෂ්‍යයන් විසින් ම විවිධ සමාජ සේවා කටයුතු සංවිධානය කරනු ලැබුවත් ඒ සඳහා විශ්වවිද්‍යාලයෙන් ලැබෙන අනුග්‍රහය සීමිත ය. විශ්වවිද්‍යාලය මගින් විධිමත්ව සංවිධානය කර ශිෂ්‍යයන් මෙන් ම කථිකාචාර්යවරුන්ගේද සහාය ඇතිව ශ්‍රමදාන, සෞඛ්‍ය කඳවුරු, සම්මන්ත්‍රණ, සමීක්ෂණ ආදිය ක්‍රියාත්මත කළ හැකි ය. ඒ තුළින් ශිෂ්‍ය අවධියේදීම සමාජීය අවශ්‍යතා හඳුනා ගැනීමටත්, සමාජයේ පවතින රැකියා අවශ්‍යතා හඳුනා ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත.
4. කථිකාචාර්යවරුන් සඳහා ඉගැන්වීම් ක්‍රම පිළිබඳ විශේෂ පුහුණු සැසි පැවැත්වීම අවශ්‍යය. විශේෂයෙන් කථිකාචාර්යවරුන්ට වැඩි පිරිසක් සිය උපාධි දේශන නැවත කියවීමට හුරු වී තිබීම නිසා දැනට ක්‍රියාත්මක දේශන ක්‍රමයෙන් මිදීමට අකමැත්තක් දක්වයි. ඉගැන්වීමේ නිරතවන ශිෂයන් සඳහා කණ්ඩායම් ක්‍රියා, බුද්ධිකලම්බනය, ගැටළු විසඳීම වැනි විවිධ ඉගැන්වීම් ක්‍රම පංති කාමරය තුළ ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂ වැඩමුළු මගින් අවබෝධය ලබාදිය හැකි ය. මේ සඳහා විශ්වවිද්‍යාල නිවාඩු කාල යොදා ගැනීමේ හැකියාව තිබේ. අවශ්‍ය විටෙක කෙටිකාලීන විදේශ

සංවාර ලබාදීමද යෝග්‍යය එමෙන්ම ආධුනික කථිකාචාර්යවරුන්ගෙන් ඉගැන්වීම් කටයුතු පළපුරුදු කථිකාචාර්යවරුන් මගින් අධීක්‍ෂණය කිරීම ද ඉතා වැදගත්වේ.

5. දේශන ශාලා සඳහා නවීන තාක්‍ෂණික උපකරණ හා පහසුකම් ලබ්දීම ද කාලීන අවශ්‍යතාවයකි. ප්‍රොජෙක්ටර්, පරිගණක යන්ත්‍ර ආදිය දේශන ශාලා සඳහා ලබාදීම අවශ්‍යය පරිගණක ආශ්‍රිත පුස්තකාල පහසුකම් පුළුල් කිරීම යුගයේ අවශ්‍යතාවයක් වී තිබේ. එසේ ම පුස්තකාලයේ හෝ පීඨය ආශ්‍රිත පරිගණක මධ්‍යස්ථානයක ශිෂ්‍යයන්ට අන්තර්ජාල පහසුකම් සැලසීම අත්‍යවශ්‍ය වේ. එම පහසුකම්වලින් උපරිම ඵල නෙලා ගැනීමට අවශ්‍ය දැනුම සහ පුහුණුව ද ශිෂ්‍යයන්ට ලබාදිය යුතු වෙයි. මෙම පහසුකම් සහන ගාස්තු ක්‍රමයක් යටතේ ලබාදීමත් අවශ්‍ය මුද්‍රණ පිටපත් අඩුමිලට ගබාගැනීමට පහසුකම් සැලසීමත් අවශ්‍යය.

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් හා වෙන සුදුසු ප්‍රතිසංස්කරණ තුළින් සමාසික ක්‍රමය තුළ දැනට වඩා ගුණාත්මක වර්ධනයක් ඇතිකරලිය හැකි බව විශ්වාස කළ හැක. එසේ නොවුන හොත් ශාස්ත්‍ර පීඨයෙන් පිටවන උපාධිධාරීන් , කිසිවෙකුගේ සැලකිල්ලට ලක්නොවන නිකමුන් පිරිසක් බවට පත්වීම වැළැක්වීම දුෂ්කරවනු ඇත.

## 6. සමාලෝචනය

සමාසික ක්‍රමය ශාස්ත්‍ර පීටය තුළ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව විමසා බැලීම මෙහිදී සිදුකරන ලදී. සමීක්‍ෂණ ක්‍රමය යටතේ අධ්‍යාපනය මෙහෙයවන ලද අතර. ශිෂ්‍ය හා කථිකාචාර්ය නියැදියක් ඒ සඳහා යොදා ගන්නා ලදී. සමාසික ක්‍රමය තුළ විෂයමාලාව, ඇගයීම් ක්‍රමය





මෙන්ම ඉගැන්වීමේ ක්‍රමයද නවීකරණය විය යුතු බව සමස්ත නියැදි ප්‍රතිචාර වලින් අනාවරණය වූ අදහස විය.

සමාසික ක්‍රමය ප්‍රතිසංවිධානය පාඨමාලාවන්හි විෂය නිර්දේශ වෙනස් කිරීමට හා අඛණ්ඩව ඇගයීමට සීමා කිරීම ප්‍රමාණවත් නොවේ. දැනට ශ්‍රී ලංකාවේ උග්‍ර ප්‍රශ්නයක් ව පවතින රැකියා ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් කුශලතා වර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සුදුසු ය. විශේෂයෙන් ම වර්තමානයේ පෞද්ගලික ආයතනවල රැකියා හඳුනා ගැනීම එම ආයතන අතර ගිවිසුම ඇතිකරගෙන, නව වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම සඳහා ඉක්මනින් තීරණය ගැනිම කාලීන අවශ්‍යතාවයකි.

නව පාඨමාලා ඇතිකිරීම, පැවරුම් හා විභාග ප්‍රමාණය අඩු කිරීම, ඇගයීම් මණ්ඩලයක් මගින් ඇගයීම් කිරීම. ප්‍රායෝගික කුශලතා වර්ධනය කිරීම ආදී කටයුතු සැලකිල්ලට භාජනය විය යුතු ක්‍ෂෙත්‍ර ලෙස හඳුනාගත හැකි විය. කථිකාචාර්යවරුන් සඳහා විශේෂ පුහුණුවක් ලබාදීම, දේශනශාලා සඳහා නවීන තාක්‍ෂණික උපකරණ ලබාදීම, පරිගණක ආශ්‍රිත පුස්තකාල හා අන්තර්ජාල පහසුකම් වැනි යෝජනා ද ඉදිරිපත් කිරීමට හැකි විය. සාමාජීය අවශ්‍යතා හඳුනාගෙන ඊට ගැළපෙන ආකාරයට සමාසික ක්‍රමය සකස් කර ගැනීම තුළින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට අවශ්‍ය අරමුණු කරා ගමන් කළ හැකිවනු ඇතැයි විශ්වාස කළ හැකි ය.

සමාසික ක්‍රමයේ ධනාත්මක ලක්‍ෂණ අවබෝධකරගෙන ඒවා දේශීය සමාජ ආර්ථික අවශ්‍යතාවන්ට උචිත වන පරිද්දෙන් ශාස්ත්‍ර පීඨයේ උපාධි අපේක්‍ෂකයන්ගේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීම ඉතා වැදගත් ප්‍රමුඛපෙළේ අවශ්‍යතාවයක් වී ඇති බව අවසාන වශයෙන් සඳහන් කළ හැක.

## References :


Barnett. (1995) Improving higher education. Total quality care, Buckingham, Open University Press. 240p

Beaty, L. (2000) Supporting lear rning from experiences in A handbook for teaching and lear rning in higher education, Enhancing Academic Practice, London , Kogan page.

Cox, B (1996) Practical pointer for University teachers, London, Kogan page. 173p

Fry, H. Ketteridge, S and Marshall, S. (2000) A handbook for teaching and lear rning in higher education, Enhancing Academic Practice, London , Kogan page 408p

Griffiths, S. (2000) Teaching and learning in small groups in A handbook for teaching and learning in higher education, Enhancing Academic Practice, London , Kogan page 408p

Hommaadi, A.H. (1990) Higher education in the third world. Delhi, Indian Bibliographies Bureau 240p

London W.S. and Shane H.G.(1993) Curriculum for a New Milennium, Bosten, Allyn and Bacon

Walker, D. (1990) Fundamentals of curriculum. Sam Diego, Harcont Brace Jovanovich.